අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/06/05/01-2022
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022.09.02

**චක්‍රලේඛ අංක - 11/2022 (I)**

සියලු ම පළාත් ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජයේ පාසල් හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

**පාසල් වාර සටහන - 2022**

පාසල් වාර සටහන - 2022 සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 2022.04.01 දිනැති 11/2022 චක්‍රලේඛයෙහි 01 හි සඳහන් පළමු වාරයේ පළමු වන අදියර හැර ඉතිරි උපදෙස් පහත පරිදි සංශෝධනය වන අතර, මින් ඉදිරියට මෙම චක්‍රලේඛයෙහි උපදෙස් බලපැවැත්වෙනු ඇත. ඒ අනුව,

01. 2022 වර්ෂය තුළ ඉදිරි කාලය සඳහා අනුගමනය කළ යුතු පාසල් වාර සටහන සහ අදාළ විස්තර පහත දැක්වේ.

**I. සිංහල හා දෙමළ පාසල් සඳහා**

| | |
|---|---|
| පළමු වාරය | <u>දෙවන අදියර</u><br>2022.06.06 සඳුදා දින සිට 2022.09.07 බදාදා දින දක්වා (දෙදින ම ඇතුළුව)<br>**(2022.09.08 දින සිට 2022.09.12 වන දින දක්වා නිවාඩු දෙනු ලැබේ)** |
| දෙවන වාරය | 2022.09.13 අඟහරුවාදා දින සිට 2022.12.01 බ්‍රහස්පතින්දා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2022.12.02 දින සිට 2023.01.02 වන දින දක්වා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2022, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2022 සහ නත්තල් උත්සවය සඳහා නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| තෙවන වාරය | 2023.01.03 අඟහරුවාදා දින සිට 2023.03.21 අඟහරුවාදා දින දක්වා (දෙදින ම ඇතුළුව) |

**II. මුස්ලිම් පාසල් සඳහා**

| | |
|---|---|
| පළමු වාරය | <u>දෙවන අදියර</u><br>2022.06.06 සඳුදා දින සිට 2022.09.07 බදාදා දින දක්වා (දෙදින ම ඇතුළුව)<br>**(2022.09.08 දින සිට 2022.09.12 වන දින දක්වා නිවාඩු දෙනු ලැබේ)** |
| දෙවන වාරය | 2022.09.13 අඟහරුවාදා දින සිට 2022.12.14 බදාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2022.12.15 දින සිට 2023.01.02 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| තෙවන වාරය | 2023.01.03 අඟහරුවාදා දින සිට 2023.03.21 අඟහරුවාදා දින දක්වා (දෙදින ම ඇතුළුව) |

**කරු.අ.පි.බ.**

02. ඒ ඒ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලට තම පළාත්වල සුවිශේෂී තත්වයනට අනුකූලව පාසල් වාර සටහන වෙනසක් කළ යුතු බව අදහස් කරන්නේ නම් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව හා 1997 අගෝස්තු මස 08 දිනැති අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්ගේ අංක 97/15 දරණ චක්‍රලේඛයට අනුව මෙම වාර සටහන වෙනස් කර ගත හැකිය.

2.1. පාසල් වාර සටහන සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1997 අගෝස්තු මස 08 දිනැති අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්ගේ අංක 97/15 දරණ චක්‍රලේඛයට අනුව ලංකාවේ සියලුම පාසල් වර්ෂයකට දින 210ක් පැවැත්විය යුතු බව අවධාරණය කර ඇතත්, 2022 වර්ෂයට යෙදෙන රජයේ නිවාඩු දිනයන්, පාසල් වර්ෂය 2022 අප්‍රේල් මස 18 වන දින ආරම්භ වූ බැවින් හා ප්‍රවාහන අපහසුතා හේතුවෙන් පාසල් වසා දැමීම මත දින 210ක් පාසල් පැවැත්වීමට නොහැකි වී ඇත. එබැවින්, 2022 වර්ෂය සඳහා රජයේ හා රජයේ අනුමත සියලු ම පෞද්ගලික පාසල් හා අනුමත පිරිවෙන්, අවම වශයෙන් දින 158ක් පැවැත්විය යුතු වේ.

2.2. 2022 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය දෙසැම්බර් මාසය තුළ සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය 2023 වර්ෂයේ මුල් භාගයේ දී පැවැත්වීමට නියමිතව ඇති බැවින්, පාසල්වල දෙසැම්බර් මස නිවාඩු කාල සීමාව වාර සටහනෙහි දක්වා ඇති ආකාරයෙන් ම ලබාදිය යුතු වේ.

03. රජය මඟින් ප්‍රකාශිත ප්‍රසිද්ධ නිවාඩු දින, සෙනසුරාදා, ඉරිදා දිනයන් හා වාර නිවාඩු කාලයන් තුළ සියලු ම පාසල් වසනු ලැබේ. එහෙත් සුවිශේෂී හේතුවක් මත පාසල පැවැත්විය යුතු දිනයක පාසල වැසීමට සිදු වුවහොත් එම දින සඳහා හිලව් සැසි පැවැත්විය යුතු වේ.

04. 2022 හා 2023 වර්ෂයන්ට අදාළ රජයේ නිවාඩු දින දර්ශනයන් මේ සමඟ ඔබ වෙත යොමු කරනු ලැබේ. (ඇමුණුම I හා II )

මෙම වාර සටහන ක්‍රියාත්මක කිරීමේ දී යම් ගැටළුවක් පැන නැගුණහොත් ඒ පිළිබඳ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් විමසන මෙන් කාරුණික ව දන්වා සිටින අතර මේ සම්බන්ධයෙන් උපදෙස් ලිපියක් පසුව නිකුත් කරන බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

දුරකථන අංක - 011- 2784845

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. රාජ්‍ය ලේකම්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමාත්‍යාංශය
2. රාජ්‍ය ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන අමාත්‍යාංශය
3. රාජ්‍ය ලේකම්, නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අමාත්‍යාංශය
4. රාජ්‍ය ලේකම්, දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන අමාත්‍යාංශය
5. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
6. විභාග කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
8. ප්‍රධාන කොමසාරිස් - ගුරු අධ්‍යාපන
9. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්
10. සාමාන්‍යාධිකාරි, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
11. සභාපති, මධ්‍යම ගමනාගමන මණ්ඩලය

ඇමුණුම I

# රජයේ නිවාඩු දින - 2022

| | | | | |
|---|---|---|---|---|
| ජනවාරි | 14 | සිකුරාදා | දෙමළ තෛපොංගල් දිනය | * = |
| ජනවාරි | 17 | සඳුදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය | * = |
| පෙබරවාරි | 04 | සිකුරාදා | නිදහස් සමරු දිනය | * = |
| පෙබරවාරි | 16 | බදාදා | නවම් පුර පසළොස්වක පෝය දිනය | * = |
| මාර්තු | 01 | අඟහරුවාදා | මහා සිව රාත්‍රී දිනය | * = |
| මාර්තු | 17 | බ්‍රහස්පතින්දා | මැදින් පුර පසළොස්වක පෝය දිනය | * = |
| අප්‍රේල් | 13 | බදාදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය | * = |
| අප්‍රේල් | 14 | බ්‍රහස්පතින්දා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය | * = |
| අප්‍රේල් | 15 | සිකුරාදා | මහ සිකුරාදා දිනය | * = |
| අප්‍රේල් | 16 | සෙනසුරාදා | බක් පුර පසළොස්වක පෝය දිනය | * = |
| මැයි | 01 | ඉරිදා | ලෝක කම්කරු දිනය | * = |
| මැයි | 03 | අඟහරුවාදා | ඊදුල් පිතර් (රාමසාන් දිනය) | * = |
| මැයි | 15 | ඉරිදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය | * = |
| මැයි | 16 | සඳුදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය | * = |
| ජූනි | 14 | අඟහරුවාදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය | * = |
| ජූලි | 10 | ඉරිදා | ඊදුල් අල්හා (හජ්ජි උත්සව දිනය) | * = |
| ජූලි | 13 | බදාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය | * = |
| අගෝස්තු | 11 | බ්‍රහස්පතින්දා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය | * = |
| සැප්තැම්බර් | 10 | සෙනසුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය | * = |
| ඔක්තෝබර් | 09 | ඉරිදා | (මීලාද්-උන්-නබි) නබි නායකතුමාගේ උපන් දිනය | * = |
| ඔක්තෝබර් | 09 | ඉරිදා | වප් පුර පසළොස්වක පෝය දිනය | * = |
| ඔක්තෝබර් | 24 | සඳුදා | දීපවාලී උත්සව දිනය | * = |
| නොවැම්බර් | 07 | සඳුදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය | * = |
| දෙසැම්බර් | 07 | බදාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය | * = |
| දෙසැම්බර් | 25 | ඉරිදා | නත්තල් උත්සව දිනය | * = |

* රජයේ නිවාඩු දින = බැංකු නිවාඩු දින

ඇමුණුම- II

# රජයේ නිවාඩු දින - 2023

| | | | | |
|---|---|---|---|---|
| ජනවාරි | 06 | සිකුරාදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය | * = |
| ජනවාරි | 15 | ඉරිදා | දෙමළ තෛපොංගල් දිනය | * = |
| පෙබරවාරි | 04 | සෙනසුරාදා | නිදහස් සමරු දිනය | * = |
| පෙබරවාරි | 05 | ඉරිදා | නවම් පුර පසළොස්වක පෝය දිනය | * = |
| පෙබරවාරි | 18 | සෙනසුරාදා | මහා සිව රාත්‍රී දිනය | * = |
| මාර්තු | 06 | සඳුදා | මැදින් පුර පසළොස්වක පෝය දිනය | * = |
| අප්‍රේල් | 05 | බදාදා | බක් පුර පසළොස්වක පෝය දිනය | * = |
| අප්‍රේල් | 07 | සිකුරාදා | මහ සිකුරාදා දිනය | * = |
| අප්‍රේල් | 13 | බ්‍රහස්පතින්දා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය | * = |
| අප්‍රේල් | 14 | සිකුරාදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය | * = |
| අප්‍රේල් | 22 | සෙනසුරාදා | ඊදුල් පිතර් (රාමසාන් දිනය) | * = |
| මැයි | 01 | සඳුදා | ලෝක කම්කරු දිනය | * = |
| මැයි | 05 | සිකුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය | * = |
| මැයි | 06 | සෙනසුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය | * = |
| ජුනි | 03 | සෙනසුරාදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය | * = |
| ජුනි | 29 | බ්‍රහස්පතින්දා | ඊදුල් අල්හා (හජ්ජි උත්සව දිනය) | * = |
| ජූලි | 03 | සඳුදා | අධි ඇසළ පුර පසළොස්වක පෝය දිනය | * = |
| අගෝස්තු | 01 | අඟහරුවාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය | * = |
| අගෝස්තු | 30 | බදාදා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය | * = |
| සැප්තැම්බර් | 28 | බ්‍රහස්පතින්දා | මිලාද-දුන්-නබි) නබි නායකතුමාගේ උපන් දිනය | * = |
| සැප්තැම්බර් | 29 | සිකුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය | * = |
| ඔක්තෝබර් | 28 | සෙනසුරාදා | වප් පුර පසළොස්වක පෝය දිනය | * = |
| නොවැම්බර් | 12 | ඉරිදා | දීපවාලී උත්සව දිනය | * = |
| නොවැම්බර් | 26 | ඉරිදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය | * = |
| දෙසැම්බර් | 25 | සඳුදා | නත්තල් උත්සව දිනය | * = |
| දෙසැම්බර් | 26 | අඟහරුවාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය | * = |

* රජයේ නිවාඩු දින = බැංකු නිවාඩු දින